මත්ද්‍රව්‍ය භාවිතා කරනා අයෙකු විසින් සිය දෙමපියන්ට පහර දී පියාව ඝාතනය කිරීමේ සිදුවීමක් සම්බන්ධයෙන්, සැප්. 29, 2022 දින විවිධ මාධ්‍ය මගින් පහත ආකාරයෙන් වාර්තා කර තිබිණි.

ඔබ සිතන ලෙසට,

1) මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු සංකීර්ණ කරුණු සමුදායක් හේතු කොට ගෙන සිදුවන, සුව කළ හැකි තත්වයක් මිස, හුදු මත්ද්‍රව්‍ය සඳහා ලොල් වීමක් නොවන හෙයින්, 'මත්ලෝලියා' වැනි යෙදුමක් ඔස්සේ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් පිළිබඳව පොදුවේ වැරදි අදහසක් සමාජගත නොවන්නේ ද?

2) "අයිස් පුතා" වැනි ඍණාත්මක ලේබල් කිරීම් ඔස්සේ, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ව කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ මුල්බැස නොගන්නේ ද? ඒ වෙනුවට, "මතට ඇබ්බැහි වූවෙකු", "මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවෙකු" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

ධනාත්මක සමාජයක් වෙනුවෙන් ඍණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!